# සීමාසහිත සීනෝර් පදනම

# - පුරප්පාඩු -

**- ව්‍යාපාර ව්‍යුහය -**

1967 වර්ෂයේ දී ආරම්භ කරන ලද සීමාසහිත සීනෝර් පදනම ධීවර අමාත්‍යාංශය යටතේ පාලනය වන නාවික යාත්‍රා, විනෝද යාත්‍රා සහ ධීවර යාත්‍රා නිෂ්පාදනය කරන එකම රාජ්‍ය සමාගම වේ.

සීමාසහිත සීනෝර් පදනමේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **අභ්‍යන්තර විගණක (MM 1-1)**

➢ **මූලික සුදුසුකම්** : බාහිර අයදුම්කරුවන් සඳහා අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජවේදී හෝ කළමනාකරණ පිළිබඳ උපාධියක් සහ උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 03ක පළපුරුද්ද

**හෝ**

වරලත් ගණකාධිකාරී ආයතනයක අන්තර් මධ්‍ය පරීක්ෂණයෙන් සමත්වීම සහ අදාළ සුදුසුකම් සපුරාගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 03ක පළපුරුද්ද හෝ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA) සමත්වීම සහ HNDA අවසන් පරීක්ෂණය සමත්වීමෙන් පසු වසර 03 ක ගිණුම් / විගණන ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අධ්‍යාපන සුදුසුකම් :**

කනිෂ්ඨ කළමනාකරණ සේවා ශ්‍රේණියේ ගිණුම් ක්ෂේත්‍රයේ පළමු ශ්‍රේණියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

➢ **වයස** : අවු. 22 ට නොඅඩු හා අවු. 35 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

➢ **වැටුප් පරිමාණය** : MM 1 - 1 2016 රු. 53,175/- 10 × 1,375/- 15 × 1,910/- = 95,575/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව)

➢ **දීමනා** : මාසිකව ප්‍රවාහන දීමනාව, සන්නිවේදන බිල්පත් ගෙවීම්, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2017 අනුව වෘත්තීය දීමනාව, භාණ්ඩාගාර අනුමත ජීවන වියදම් දීමනාව

රජයේ සේවයේ දැනටමත් නිරත අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ අංශ ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතු වේ.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉහත දක්වා ඇති සුදුසුකම්වලට අදාළ සහතිකවල ඡායා පිටපත් සමග පහත දක්වා ඇති ලිපිනයට මෙම දැන්වීමෙන් දින 07 ක් තුළ තනතුර ලියුම් කවරයෙහි වම් කෙළවරෙහි සඳහන් කොට ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතු වේ. ඉහත සුදුසුකම් සපුරා ඇති බව තහවුරු කර ගැනීමට නොහැකි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**සීමාසහිත සීනෝර් පදනම**
**අංක 335 (90),**
**ඩී.ආර්. විජේවර්ධන මාවත,**
**කොළඹ 10.**

**දු. අ. 011-2448040 / 011-2524484**